UDA එක NVQ වලට දුන්නෙ "ලෙලි පොල්" ද

නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 ජුලි මස 8 වන දින නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ නව ගොඩනැගිලි රෙගුලාසි වලින් මෙතෙක් පැවති ගොඩනැගිලි නීති රීති සියල්ල සංශෝධනය වන බව එම ගැසට් පත්‍රයේම සඳහන් කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2235/54 - 2021 ජූලි මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2021.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 21 වන වගන්තිය යටතේ, 1986.03.10 වැනි දිනැති අංක 392/9, 1994.06.01 දිනැති අංක 821/19, 1996.08.06 දිනැති අංක 935/6, 1999.02.24 දිනැති අංක 1068/13, 2006.08.23 දිනැති අංක 1459/20, 2008.02.27 දිනැති අංක 1538/24, 2008.06.27 දිනැති අංක 1555/32, 2009.04.17 දිනැති අංක 1597/8, 2009.05.30 දිනැති අංක 1603/53, 2011.04.12 දිනැති අංක 1701/13 යටතේ ගැසට් කරන ලද සැලසුම් හා ගොඩනැගිලි නියෝග/රෙගුලාසි (පොදු), මේ සමඟ අමුණා ඇති නැවත අවලංගු කර සාදනු ලැබූ නව සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසින් වේ.

මහින්ද රාජපක්ෂ,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2021 ජූලි මස 05 වැනි දින,
කොළඹ.

ඒ අනුව මෙම නීතිරීති ශ්‍රී ලංකාව පුරාම ක්‍රියාත්මක වීමට නියමිත නව ගොඩනැගිලි රෙගුලාසි වනු ඇත.
මෙම නව ගොඩනැගිලි රෙගුලාසි ගැසට් පත්‍රයෙන් නාගරික සංවර්ධන අධිකාරිය NVQ සුදුසුකම ඇති සැලසුම් ශිල්පීන් සඳහා (Building Drafting Technologists– NVQ) සඳහා වර්ග අඩි 5500 ක් හෙවත් වර්ග මීටර් 500 නේවාසික ගොඩනැගිලි සහ වර්ග අඩි 4400 ක් හෙවත් වර්ග මීටර් 400 ක නේවාසික නොවන ගොඩනැගිලි නිර්මාණය සඳහා අවසර දී ඇත.

5	ගොඩනැගිලි ඉදිකිරීම	නිර්මාණය කිරීම, සහ ඉදිකිරීම කටයුතු කිරීම සහ සහතික කිරීම	වර්ග මීටර් 500 දක්වා වූ නේවාසික ගොඩනැගිලි සහ වර්ග මීටර් 400 දක්වා වන නේවාසික නොවන ගොඩනැගිලි ආ වර්ගයට අයත් නොවන	• මෙහි සැලසුම් සහ සංවර්ධන රෙගුලාසීන්ට අනුකූලවන පරිදි සහ ව්‍යුහාත්මකව ස්ථාවර වන පරිදි ගොඩනැගිල්ල සැලසුම් කිරීම. • නිරන්තර අධීක්ෂණය හා වාර්තා කිරීම • අනුකූලතා සහතිකය සඳහාවන නිර්දේශය ඉදිරිපත් කිරීම.	සැලසුම් නාක්ෂණ (ගොඩනැගිලි) NVQ පස්වන මට්ටමෙහි සුදුසුකම් ලත් පුද්ගලයකු හෝ වෙනත් සුදුසුකම් ලත් තැනැත්තෙකු

නමුත් මෙම ගැසට් පත්‍රය පරීක්ෂාකාරීව කියවීමේ දී මෙම සුදුසුකම පිළිගැනීම **<u>බල්ලන්ට ලෙලි පොල් දීමක්ද</u>** යන සැකය අප වෙත ඇතිව තිබේ.

*<u>NVQ **වලට ඇකැප 'ආ' වර්ගය නොහොත්** Category B</u>*

මෙහි 'ඇ' වර්ගය නොහොත් 'C' වර්ගයේ ගොඩනැගිලි ගැන සඳහන් කිරීමේදී *<u>'ආ' වර්ගයට අයත් නොවන</u>* (Category 'B') යන වගන්තිය නිරතුරුවම සඳහන් ව තිබීම නිරීක්ෂනය කල හැක..
මෙහි 'ආ' වර්ගය නොහොත් 'B' වර්ගයේ ගොඩනැගිලි වශයෙන් දක්වා ඇති කරුනු සලකනවිට ඔබ විසින් මෙතෙක් කාලයක් නිර්මානය කර ඇති ගොඩනැගිලි වලින් බොහෝ ප්‍රමානයක් මෙම 'ආ' වර්ගයට අයත් වනබව පෙනීයනු ඇත.

10 A I කොටස : (I) ඡේදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2021.07.08

අංකය	වර්ගීකරණය		බිම ප්‍රමාණය (වර්ග මීටර්)	වෙනත් ලක්ෂණ
	ප්‍රධාන වර්ගීකරණය	අනු වර්ගී කරණය		
31.2	ආ		_____	• බිත්ති සහ කුළුණු සමග ඉඩමේ මායිමෙහි පිහිටා ඇති ඉදිකිරීමක්; • පා මහලක් සහිත ගොඩනැගිල්ලක්; • පයිල්ස්, සිලින්ඩර්ස්, කැසිනොස් හෝ පාංශු වැඩි දියුණු කිරීම් ඇතුළු කැනීම් සහ බැක් පිල්ස් හෝ රාෆ්ට් සහ ස්ට්‍රිප් අත්තිවාරම් ඇතුළු ඕනෑම ආකාරයක ගැඹුරු අත්තිවාරමක් සහිත ගොඩනැගිල්ලක්; • මීටර් 10 ට වඩා දිගු වහලයක් සහිත ගොඩනැගිල්ලක්; • මහජනයා රැස්වන ස්ථානයක් හෝ පොදු ගොඩනැගිල්ලක්; • ගබඩා සහ කර්මාන්තශාලා වැනි සුළං සඳහා සංවේදී ගොඩනැගිල්ලක්; • භූමියෙහි බැවුම අංශක 20 සිට 45 දක්වා වන ඉඩම් කොටසක ගොඩනැගිල්ලක් ඉදිකිරීමකදී; • විවිධාකාර වගකීම් සහිත සහ ආපදා තත්වයන්හිදී ස්ථාවර විය යුතු ගොඩනැගිල්ලක්;
31.3	ඇ	I	"ආ" වර්ගයට අයත් නොවන වර්ග මීටර් 500 දක්වා වූ නේවාසික ගොඩනැගිලි සහ වර්ග මීටර් 400 දක්වා වන නේවාසික නොවන ගොඩනැගිලි	• පා මහලක් නොඉක්මවූ සහ මීටර් 2 කට වඩා නොවැඩි අත්තිවාරම් කැපීමක් සහිත ගොඩනැගිල්ලක්; • පිහිටි පොළවේ සිට මීටර් 3 කට වඩා අඩු උසකින් යුතු පැති බැමීමක්; • ඉඩමේ බැවුම අංශක 20 ට වඩා අඩු ස්ථානයන්හි ඉදිකරන ගොඩනැගිලි;

ඒ අනුව ඔබ මෙතෙක් නිර්මානය කරනලද
* බිත්තියක් හෝ කුලුනක් මායිමේ පිහිටා ඇති ගොඩනැගිලි,
* අඩි 30 ට වැඩි දිගින් යුත් වහල සහිත ගොඩනැගිලි,
පමනක් නොව
*මහජනයා රැස්වෙන ස්ථාන යටතට ගැනෙන

කඩ කාමරයක් හෝ කුඩා කාර්යාලයක් හෝ සහිත නිවාස පවා නිර්මානය ඔබට අහිමිවනු ඇත,

<u>ඊට අමතරව ආනතිය අංශක 20 ට වැඩි ආනතියකින් යුතු ඉඩම් කොටසක ඉදිකරන ගොඩනැගිලි වශයෙන් අලුත් ගොඩනැගිලි කාන්ඩයක්ද මෙම 'ආ' වර්ගයට ඇතුලු කොට ඇත.</u>

අවාසනාවකට මෙම 'ආ' වර්ගයේ ගොඩනැගිලි NVQ ඇති හෝ නැති කිසිම සැලසුම් ශිල්පියෙකුට නිර්මානය කිරීමට නොහැකි අතර ඒවා නිර්මානය සඳහා **<u>වරලත් වාස්තු විද්‍යාඥයෙක්</u>** (Chartered Architect) සහ **<u>වරලත් ඉංජිනේරුවෙක්</u>** (Chartered Engineer) යන **<u>දෙදෙනාම</u>** අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ.

<u>බොහෝ පලාත් පාලන ආයතන වරලත් ඉංජිනේරු සහතිකය පමනක් සලකා සැලසුම් ශිල්පීන් නිර්මානය කරන ලද සැලසුම් මෙතෙක් අනුමත කලමුත් නව ගැසට් පත්‍රය ක්‍රියාත්මක වීමෙන් පසු එසේ අනුමතකල නොහැකි වනු ඇත.</u>

මෙම ගොඩනැගිලි 'ආ' වර්ගය ලෙස වෙන් කිරීම කර ඇත්තේ එම ගොඩනැගිලිවල ඉංජිනේරුමය සහ ව්‍යුවිහාත්මක අවශ්‍යතා නිසා බව සාමාන්‍ය පුද්ගලයෙකුට වුවත් වටහා ගතහැකි කරුනකි.
එම නිසා මෙම ගොඩනැගිලි අනුමත කිරීම සඳහා වරලත් ඉංජිනේරු සහතිකයක් ඉල්ලා සිටීම මහජන ආරක්ෂාව සඳහා ගතයුතු සාධාරන ක්‍රියාමාර්ගයකි.

<u>නමුත් මෙම ගොඩනැගිලි නිර්මානය වරලත් වාස්තු විද්‍යාඥයින් සතු කිරීමට නීතියක් පැනවීම කිසි ලෙසකින් සාධාරන යැයි කිවනොහැකිය</u>.

මේ අනුව වර්ග මීටර් 500 ක් දක්වා ගොඩනැගිලි නිර්මානය NVQ ඩිප්ලෝමධාරීන් හට බැලූ බැල්මට ලබාදී තිබුනද, සත්‍ය වශයෙන්ම ලැබෙන්නේ ඉන් අඩකටත් අඩු ප්‍රමානයක් බව සක්සුදක් සේ පැහැදිලිය.

<u>NVQ ඩිප්ලෝමධාරීන් ගොඩනැගිලි නිර්මානය සඳහා පිලිගැනීම බල්ලන්ට ලෙලිපොල් දීමක් සේ මා මුලින්ම සඳහන් කලේ මේ හෙයිනි.</u>

නාගරික සංවර්ධන අධිකාරිය මෙම නීති පැනවීම සිතාමතා කරනලද ක්‍රියාවක් වන්නට හැකිය. එසේ නොවන්නටද හැකිය.

නමුත් මෙම නීතිය සාධාරන ලෙස වෙනස් කිරීමට සියලු සැලසුම් ශිල්පීන් දැවැන්ත ක්‍රියාමාර්ගයක් ගතයුතුව තිබේ.

කුමක් නිසාදයත් දැනට ශ්‍රී ලංකාවේ නිර්මානකරනයේ යෙදෙන 40000(හතලිස්දාහක්) පමන වූ ද, වසරකට කාර්මික විද්‍යාල සහ වෘත්තීය පුහුනු ආයතන වලින් සුදුසුකම් ලබන 2000 ක් පමන වූ ද සැලසුම් ශිල්පීන් හට වෘත්තීය තලයට පිවිසීමට ඇති එකම මග <u>NVQ</u> වීමයි.

එහෙයින් වර්ග මීටර් 500 දක්වා 'ආ' වර්ගයට අයත්වන ගොඩනැගිලි නිර්මානය කිරීම **<u>වරලත් ඉංජිනේරුවරයා සමග NVQ ඩිප්ලෝමාධාරියාහට හැකිවන පරිදි</u>** නීති රීති වෙනස් කිරීම සඳහා දැවැන්ත හඬක් නැගීමට ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණ ආයතනය සමග අත්වැල් බැඳගන්නා ලෙස සාධාරන සමාජයක් අපේක්ෂා කරන සියලු දෙනාගෙන්ම මෙයින් ඉල්ලා සිටිමි.

කීර්ති ජයලත්
සභාපති
තාක්ෂණ අධ්‍යාපන කමිටුව
ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණයන්ගේ ආයතනය

03-08-2021